# මුන්දෙනි ආරු නිම්නයේ මූල ඓතිහාසික යුගයේ ජනාවාසකරණය පිළිබඳ අධ්‍යනයක්

ආර්.ඒ.බී.ඩී. රණසිංහ*

ශිලා යුගයේ අවසාන අවධියත් ඓතිහාසික යුගයේ ආරම්භක අවධියත් අතර වූ සංක්‍රාන්තික සමය මූල ඓතිහාසික අවධිය (proto historic period) ලෙස හඳුන්වනු ලැබේ. මිනිසා සංවිධානාත්මක ලෙස ජනාවාස බිහිකර ගැනීම සම්බන්ධයෙන් වැදගත් සාක්ෂි හමුවන කාල පරිච්ඡේදයක් ලෙස මෙම අවධිය සලකනු ලබයි. මූල ඓතිහාසික අවධිය නියෝජනය කරන පුරා ස්ථාන අතර නාගරික හා වරාය මධ්‍යස්ථාන, ක්‍රි.පූ 03 වන සියවස සිට මෙපිටට පැවත එන පැරණි බෞද්ධ ගුහා සංඝාවාස, ඊට මදක් පෙර කාලයකින් පැවත එන මෙගලිතික සුසාන සංකීර්ණ, සත්‍ය ග්‍රාමීය ජනාවාස භූමි, ග්‍රාමීය මට්ටමේ වාරි කර්මාන්ත ප්‍රමුඛ වෙයි. ශ්‍රී ලංකාවේ මූල ඓතිහාසික ජනාවාස ප්‍රධාන වශයෙන් වියළි කලාපීය ගංගා නිම්නශ්‍රිතව ස්ථානගත වී තිබෙන බව පෙනේ.දීර්ඝ කාලීන වියළි ස්වභාවය මත කෘතිම ජල සම්පාදනයෙන් සාර්ථක ලෙස කෘෂිකාර්මික කටයුතුවල නිරත වීමට හැකිවීම එයට හේතුව ලෙස දැක්විය හැකිය. මුන්දෙනි ආරු නිම්නය මූල ඓතිහාසික යුගය නියෝජනය කරන බෞද්ධ ගුහා සංඝාවාස හා මූල බ්‍රාහ්මීය ලිපි, පැරණි වාරි කර්මාන්ත, මෙගලිතික සුසාන සංකීර්ණ වලින් බහුල ප්‍රදේශයකි. මෙම අධ්‍යයනයට භාජනය වන මුන්දෙනි ආරු නිම්නය වර්තමාන ටැම්පිටිය ගම්මානය ආශ්‍රිතව හමු වේ. අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ගම්මානය තදාශ්‍රිතයේ ජනාවාසකරණ ඉතිහාසය සෙවීම අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණ වේ. අධ්‍යයන අරමුණ සාර්ථක කරගැනීම සඳහා ලිඛිත මූලාශ්‍ර අධ්‍යනය, ක්ෂේත්‍රගත අධ්‍යයනය, ඡායාරූප ලබා ගැනීම, ශිලා ලිපි පිටපත් කර අධ්‍යනය කිරීම ආදිය සිදුකරන ලදී. මූල බ්‍රාහ්මීය ලිපි විස්ථාරණය හා මෙගලිතික සුසාන භූමි ස්ථානවලට අනුව දිවයිනේ වයඹදිග ප්‍රදේශයේ මූල ඓතිහාසික ජනාවාසකරණය ගොඩනගා තිබේ. දිවයිනේ ගිනිකොණදිග ප්‍රදේශයේ මූල ඓතිහාසික ජනාවාස පසුබිම ගොඩනැගීමත්, පුරාවිද්‍යාඥයින්ගේ පර්යේෂණ යොමුකළ යුතු ප්‍රදේශයක් අනාවරණය කිරීමත් අපේක්ෂිත සෙසු අරමුණු වේ.

ප්‍රමුඛ පද :- මූල ඓතිහාසික ජනාවාස, ගුහා සංඝාවාස, මූල බ්‍රාහ්මීය ලිපි, වාරි කර්මාන්ත, මෙගලිතික සුසාන සංකීර්ණ

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය buddhikadhananjaya91@gmail.com